
# ගමයි කෙතයි



බුලත්සිංහල වෙල්යාය ඉතාමත් විශාල ය. කරල්දැක්කුවේ වෙල්යාය එතරම් විශාල නොවූවත් ගමේ හැටියට තරමක ප්‍රදේශයක් වසා පැතිරී ඇත. ඇළේ ඇඳි පාලම ළඟ සිට මාළු අල්ලන බෝක්කුව යනුවෙන් හඳුන්වනු ලබන බෝක්කුව ළඟට යනතුරු පාර දෙපස සිට ඈත එපිට දක්වා දිවගොස් කඳුයාය පාමුලින් අවසන් වන වෙල් යාය අප පළාතේ බොහෝ දෙනෙකුට අයත්ව පැවතුණි. මෙම කුඹුරු යාය මගේ ජීවිතයට විශාල අත්දැකීම් රාශියක් එකතු කරන ලද තෝතැන්නක් බැවින් අද ද ඒ හරහා යනවිට සිතට ගතට දැනෙන මිහිර සිසිලස අනන්ත ය.

කුඹුරු කොටන, වපුරන කාලයේ සිට ගොයම් කපා පාගා වී ටික ගෙදරට ගන්නා තෙක් සියලු ම වැඩ වලට මගේ තරමේ හැටියට සම්බන්ධ වී ඇත්තෙමි. තම තමාගේ කුඹුරු කොටා වපුරා ගන්නා පිරිස මෙන් ම අඳයට කුඹුරු වැඩ කරන පිරිස ද ඇත. අඳයට වැඩ කරනවා යැයි කියන්නේ වෙන කෙනෙකුගේ කුඹුරක් කොටා, වපුරා, කපා, පාගා වැඩ කිරීමයි. අස්වැන්නේ කොටසක් අයිතිකරුට දීමේ පොරොන්දුව පිට වගා කිරීම අඳය ලෙස පැවසේ. අයිතිකරුට දීමේ කොටස විවිධ ආකාරයෙන් මුල දී කරගනු ලබන පොරොන්දුව අනුව සිදුකෙරේ. "ඇටයි බිත්තරයි දීලා දෙකෙන් පංගුවට කරනවා." යනුවෙන් එක් ක්‍රමයකි. මෙතන ''ඇට'' යනුවෙන් හැඳින්වෙන්නේ ගෙරිකටු පොහොර ය. "බිත්තර" යනුවෙන් හැඳින්වෙන්නේ වැපිරීම සඳහා ම විශේෂයෙන් සකස් කර ගන්නා වී වලට ය. කුඹුරු අයිතිකරු විසින් බිත්තර වී සහ ගෙරිකටු පොහොර කුඹුර වගා කරන්නාට දෙනු ලබයි. වගා කරන්නා කළ යුත්තේ නිසි පරිදි කුඹුර කොටා, මඩකර, පොහොර දමා, වී ඉස, රැක බලා ගෙන, අස්වැන්න නෙලා ලැබෙන අස්වැන්නෙන් දෙකෙන් කොටසක් දීම ය.




තවත් ක්‍රමයක් වන්නේ "හතරෙන් එකට" කිරීම ය. එම ක්‍රමයට කුඹුර අයිතිකරු විසින් කිසිවක් දෙනු නොලබන අතර වගා කරන්නා විසින් ම පොහොර සහ බිත්තර වී යොදා කුඹුර වගාකර බිම් පංගුව වශයෙන් අස්වැන්නෙන් හතරෙන් කොටසක් දිය යුතු වේ.

අපේ යැයි කුඹුරු තිබුණේ අතුර මූකළානේ වී ලාස් දෙකක් වැපිරෙන පුංචි කුඹුරක් පමණි. එම කුඹුර මා තනියම කොටා මඩ කරන අතර වී ඉසීමට හා ගොයම් කපා පෑගීමට පමණක් තාත්තා හා අම්මා උදව් කළෝ ය. ඒ හැරෙන්නට අප කුඹුරු වැඩ කළේ ද අඳයට ම ය. තාත්තා එක් එක් අයිතිකරුවන්ගේ කුඹුරු වැඩ කිරීම පිණිස ලබාගෙන වගා කළේ ය. බොහෝ කුඹුරු කළේ හතරෙන් පංගුවට ය. වී පෑලක් යනු වී කුරුණි (ලාස්) දහයක් වැපිරෙන අක්කරයක් පමණ වූ බිම් ප්‍රමාණයකි. මහ සහ යල දෙකන්නයට ම වගා කිරීම පිණිස එම කුඹුරු අඳයට ගත හැකි ය. යල-මහ යනු අවුරුද්දට දෙවතාවක් කුඹුරු වැපිරීම ය. මෙයට යල කන්නය සහ මහ කන්නය යනුවෙන් ද වැහැරේ. අත්තම් ක්‍රමයට කුඹුරු වැඩ කිරීම පහසුවා මෙන් ම මුදල් ද වැඩිපුර වියදම් නොවන ක්‍රමයකි. වෙනත් රැකියාවක් නොමැති බැවින් බොහෝ දෙනා අත මුදල් ගැවසෙන්නේ ද නැත. දවසකට රුපියල් දෙක බැගින් කුලිය ගෙවා කුඹුරු කෙටීම වැපිරීම හෝ ගොයම් කැපීම ආදී සියලු වැඩ කරවා ගැනීමට නොහැකි ය. එබැවින් මෙම අත්තම් ක්‍රමය ගොවීන් සැමට ම ඉතා ප්‍රයෝජනවත් ඵලදායී පිළිවෙතක් විය. කුඹුරු වගා කරන ගොවීන් හත්අට දෙනෙක් එකතු වී තමතමන්ගේ කුඹුර කොටන දින බෙදා ගනිති. එම සියලු දෙනා ම එකතු වී එක් අයෙකුගේ කුඹුරක් එක් දිනක දී කොටති. මෙසේ දවස් කීපයක් වැඩ කර සියලු දෙනාගේ කුඹුරු කෙටීම අවසන් කර ගනිති. කුඹුර වගා කරන හිමියා ඔවුන්ට අවශ්‍ය සියලු දේ සපයනු ලබයි. උදයට කෑම, තේ, බුලත් විට දහවල් කෑම ආදිය සැපයිය යුතු ය. බොහෝ විට උදයට සුදු හාලේ බතක් හා පොල් සම්බලයක් සාදා සංග්‍රහ කරති. දවල්ට එළවලු දෙකක් සමඟ කරවල හොද්දක් හෝ කරවල බැදුමක් සාදා සංග්‍රහ කරති. බොහෝ විට කරවල වර්ගය වන්නේ අඟුළු කරවල ය. දහවල් වන විට නිවැසි කාන්තාවන් පිසූ කෑම, බත් මාළුපිනි වෙන්වෙන් වශයෙන් කොළපත් මුල්වල බැඳ, බටපොතු පෙට්ටි ඇතුළට දමා හිස මත තබාගෙන, සමහර විට හොදි මුට්ටියක් අතේ එල්ලාගෙන වේලි දිගේ ගමන් ගන්නා ආකාරය ගොවිතැන් වැඩ කරන දිනවල දකින්නට හැකි මනස්කාන්ත දර්ශනයකි. මෙහි දී කෑම බෙදීම සඳහා කෙසෙල් කොළ ද, වතුර බීම සඳහා හොඳින් පෙරන්ගා පිරිසිදු කළ පොල්කටු ද භාවිතයට ගනිති.

සියලු දෙනා බොහෝ සමගියෙන් කුඹුර ඉතා උනන්දුවෙන් කොටති. එක් අයෙක් හෝ වැඩට බොරු නොකරයි. සියලු ම දෙනා සෑම කුඹුරක් ම තමාගේ ම කුඹුරක් ලෙස සලකති.

පළමුවැනි කෙටීමට පුරං කෙටීම යනුවෙන් වැහැරෙයි. එය කරනු ලබන්නේ පලමන් පේළි ක්‍රමයට ය. එක් අයෙක් පෝර උදැල්ලෙන් තමන් ඉදිරියේ මඩ පිඩැල්ල පෙරළාගෙන යයි. එසේ කරන්නේ එක දිගට පේළියක් වශයෙනි. එම පේළිය හැඳින්වෙන්නේ පලමන ලෙස ය. පෝර උදැල්ල යනු සාමාන්‍ය උදැල්ලට වඩා දිගින් වැඩි උසින් අඩු උදැල්ලකි. කුඹුරේ එක් ලියැද්දකින් අරඹන පුරං කෙටීම කරනු ලබන්නේ උදලු තලයේ උසට වඩා දෙගුණයක් ඉදිරියෙන් උදලු පහර ගසා පස් පිඩැල්ල තමා දෙසට පෙරළීමෙනි. දෙගුණයක් ඉදිරියෙන් ඇති උදලු තලය උස ප්‍රමාණයට ම ඉතිරිව ඇති බටදැල්ල, ගොයම් කොට ආදියෙන් යුතු කොටස වැසෙන සේ මඩ පිඬු පෙරළනු ලැබේ. මෙසේ එක් අයෙක් ආරම්භ කරනු ලබන කෙටීමට ඉදිරියෙන් අනෙකා පිඩැලි පෙරළාගෙන යයි. මෙසේ සියලු දෙනා ම පේළියෙන් පේළිය පෙරළමින් ඉදිරියට කොටා ගෙන යති. මුලින් ම ගිය තැනැත්තා පලමන් පේළිය ඉවර වූ පසු වෙනත් ලියද්දකින් හෝ විශාල ලියද්දක නම් ලියැද්ද මැද තවත් පේළියකින් ආරම්භ කරයි. එය කොටාගෙන එන්නේ අනිත් පැත්තටයි. එනම් මුලින් සඳහන් පේළිය වමේ සිට දකුණට කෙටුවා නම්, දෙවන වරට අරඹන පේළිය දකුණේ සිට වමට පෙරළාගෙන යයි. ගොවියාගේ දෑත් දෙපසට ම කෙටීම සඳහා හුරු වී ඇත. මූලිකයා පසුපසින් අනිත් සියලු දෙනාත් ඔහු අනුගමනය කරමින් කොටාගෙන යති. පලමන් කෙටීම මට ද හොඳට හුරු ය. මා වයසින් මෙන් ම ශරීරයෙන් පුංචි වූවත් පිරිස මැද ම මම ද පේළියට කෙටීම අරඹා මගේ පුංචි උදැල්ලෙන් හැකි වෙර යොදාගෙන කොටා ගෙන යමි. කෙසේවත් පලමන් පේළිය මැද නැවතීමට නොහැකි ය. එබැවින් කොතරම් වෙහෙස වූවත් පලමන් පේළිය අවසන් වන තුරු කෙටීමට මම ද පුරුදු වී සිටියෙමි.

අත්තම් ක්‍රමයට ම දෙමේ කෙටීම හෙවත් දෙවෙනි වර කෙටීම සිදු කර ගනිති. දෙමේ කෙටීම කරනු ලබනුයේ පුරන් කෙටීමේ දී පෙරළන ලද මඩ පිඩැල්ල නැවත පෙරළීමයි. මෙය කරනු ලබන්නේ පුරන් කොටා සතියක් පමණ ගිය පසු ය. තණකොළ, බටදැල්ල, ගොයම් කොට ආදිය තැම්බී දැනෙන මඩ සුවඳට ගොවියා කැමති ය. දෙමේ කෙටීමෙන් පසු තම තමන්ගේ කුඹුරුවල වතුර බැඳීම, වක්කඩ බැඳීම, කැඩීම, නිසි අයුරින් පෝර දැමීම ආදිය තමා විසින් ම කර ගනී. පෝර වශයෙන් එකල රට පෝර භාවිත කළේ ම නැත. ගෙරිකටු පෝර භාවිත කළ අතර ඒවා සකස් කර ඇත්තේ ගවාදී සතුන්ගේ ඇටකටු කුඩු කිරීමෙනි.

කුඹුරු කොටන කාලයේ දී සියලු ම ගොවීන්ගේ දෑත් උදලු මිටට තද වී කරගැට නමින් හඳුන්වනු ලබන තරමක් වේදනාවෙන් යුතු තුවාල විශේෂය අල්ලේ මතු වූවත් පොල්තෙල් පහනක් දල්වා, දැල්ලේ රස්නයට බුලත් කොළයක් අල්ලා එයින් තැවීමෙන් එම වේදනාව තුනී කර ගනිති.

කුඹුරු කෙටීමේ ක්‍රමයට අමතරව සී සෑම සහ මැඩවීම සිදු කර කුඹුරෙහි මඩ සාදා ගැනීම ද කරනු ලබයි. නගුල නම් සී සාන උපකරණයට ගවයන් දෙදෙනකු බැඳිය හැකි ය. ගවයන් විසින් නගුල ඇදගෙන යන අතර හරකුන්ට පිටුපසින් නගුල අල්ලාගෙන යන ගොවියා නිසි පිළිවෙළට මඩ පෙරළී යන ආකාරයට එය හසුරුවයි. අබිලියන් මාමලාගේ ගෙදර නගුල් කිහිපයක් ම තිබුණු අතර හරක් ද කිහිප දෙනෙකු ඇති කරනු ලැබූහ. මා ද අබිලියන් මාමාගේ පුතුන් වන ලෙයස් අයියා සහ සෝමදාස, සමග සී සෑමේ යෙදී ඇත. එවකට සිරිසේන, රාජා සහ පුංචි අප්පුහාමි යන අය මට වඩා කුඩා ය.

කුඹුරු මැඩවීම කරනු ලබන්නේ මී හරකුන්ගෙනි. මී හරක් තුන්දෙනා බැගින් එකට පේළියට බැඳ එවන් කිහිපයක් කුඹුරට යොදවා කිසියම් වූ පේළි ක්‍රමයකට හරක් දැක්කීමෙන් කුඹුර මඩ කර ගනිති.

මඩ කර ගත් කුඹුරෙහි වී ඉසීම කරනු ලබන්නේ වතුර බැස යාම සඳහා ලියැද්ද පුරා නිසි පරිදි ඇළ පාරවල් සකස් කොට මඩ තුනී කිරීමෙන් පසුව ය. වී ඉසීම සඳහා යෙදෙනුයේ පළපුරුදු කෙනෙකි. සියලු ම තැන්හි ක්‍රමානුකූල පිළිවෙලකට වී ඉසීම කළ යුතු ය. ඒ සඳහා බටපොතුවලින් වියන ලද පෙට්ටියකට ගෙරිකටු පෝර සමඟ මිශ්‍ර කළ පැළ වී දමා එය වමතින් පපුවට හිරවන සේ තබා ගෙන දකුණතින් වී ඉසියි. වී ඉසීමේ ක්‍රියාවලිය සඳහා ද අත, අත්ල සහ ඇඟිලි හුරු වී තිබිය යුතු ම ය. කලාතුරකින් කුඹුරක පැල ගොයම් සිටුවීම ද සිදු කෙරේ. එවකට වැපිරීම සඳහා වී වර්ග කිහිපයක් භාවිත කළ අතර ඒවායින් කීපයක් නම් වශයෙන් දෙවැරැද්දිරි, මුරුංගකායන්, රතු වී, ලුම්බිණි, සුවඳැල්, කහට වී, බටපොලඇල් හෙවත් හේරත්බණ්ඩා, හීනටි, පන්නිටි, කිරිනාරං, හොඬරවාල, මඩඇල්, මාවී ආදිය වේ.

අප සියලු දෙනා ම ගොවිතැන් වැඩ කරන විට අඳින ඇඳුම අමුඩය යි. අමුඩය ගසා ගැනීම සඳහා උපයෝගි කොට ගන්නේ සෑම අයකුගේ ම ඉණේ බැඳ ඇති දිය ලණුව නමින් හැඳින්වෙන නූලකි. එය ස්ථිර ලෙස ම ඉණේ බැඳ ගෙන සිටීම ගොවියා ගේ පුරුද්ද ය.

කරල්දැක්ම වෙල් යායට වතුර ලබා දීම පිණිස සාදා ඇති "බන්ටි" එක අපගේ නාන තටාකය වී තිබුණි. මාරහේන අසල ඇති ගල්වළට අමතරව, ඇළේ නෑම සඳහා වතුර එක් රැස් වුණු ස්ථානය "බන්ටි" එක ය. මාරහේන කැලෑවේ සිසිල් සෙවණ අතරින් ගලා එන සීතල වතුර අප ගත සිත ප්‍රබෝධමත් කරයි. කුඹුරු වැඩ කළ පසු හැන්දෑවේ දී ඇළට බැස නා ගැනීම දවසේ වෙහෙස නිවාලන සුවදායක සවසකට හේතු වේ.

කුඹුරු මඩ කරන කාලයේ දී නොවරදවා ම සිදුවන තවත් දෙයක් නම් පිරිස එකතු වී මාළු ඇල්ලීම සඳහා වළවල් ඉසීම ය. වක්කඩවල් අසල ලොකුවට හෑරෙන මාළු සිටින වළවල් සහ ඇළ දිගේ ඇති වැඩිපුර මාළු ගැවසෙන ස්ථාන හරස්කොට වතුර ඉස මාළු අල්ලති. වළක් ඉසීමේ දී මුලින් වළ පස්වලින් හෝ මඩවලින් කොටු කර වතුර ඉසීම ආරම්භ කරනු ලැබේ. වතුර තරමක් හිඳුණු පසුව බටපොතුවලින් වියන ලද හිල් කූඩයකින් පෙරී යන පරිදි ජලය ඉසිනු ලැබේ. වතුරත් සමග එන මාළු කූඩයේ හිර වෙති. මෙසේ වළේ වතුර අවසන් වන තුරු ම ඉසීමෙන් පසු කූඩයට එකතුවන මාළු සහ වළේ ඉතිරිවන මාළු අතින් අල්ලා වෙනත් භාජනයකට දමති. මඩකරියන්, කණයන්, හුංගන්, කාවයියන්, අංකුට්ටන්, ඉස්සන්, දණ්ඩින්, වැලිගොව්වන්, ආඳුන් ආදී වූ විවිධ මාළුන්ගෙන් මාළු භාජනය පිරේ. හුංගා සහ අංකුට්ටා දළ සහිත මාළු ය. මාළු අල්ලන සෑම කෙනෙක් ම පාහේ මෙම මාළුවන්ගේ තුඩු පහරට ලක් වෙති. ටික වේලාවකින් වේදනාව පහව යන අතර කලාතුරකින් කෙනෙකුගේ වේදනාව දවසක් හමාරක් පවතින අවස්ථා ද ඇත. අල්ලා ගත් මාළු, වළ ඉසීම සඳහා හවුල් වූ සියලු දෙනා අතර සම සේ බෙදා ගනිති.

ගොයම් කපන කාලය මුළු ගම ම අමුතු ප්‍රබෝධයකින් පසුවන කාලයකි. ගොයම් සුවඳ මුළු ගම සිසාරා යයි. ගොයම් කැපීම ද බොහෝ විට අත්තම් ක්‍රමයට ම සිදුවන අතර වැඩිපුර අවශ්‍ය වන කීප දෙනෙකු කුලියට ගැනීම ද සිදුවේ. මේ සඳහා ගොවිතැන් වැඩ හොඳින් පුහුණු මාරහේන වත්තේ ද්‍රවිඩ පිරිස ද පැමිණෙති. ඔවුහු ද අපගේ චාරිත්‍රවාරිත්‍ර මහත් සේ ගරු කරමින් ගොවිතැන් වැඩවලට හවුල් වෙති. දවසේ ගොයම් කැපීම සඳහා ගැහැනු අයකුට නම් රුපියල් දෙකක් කුලිය වශයෙන් ගෙවනු ලැබේ. පිරිමි කෙනෙකුට ගොයම් කැපීම හෝ අමතරව ඇති වැඩ සඳහා රුපියල් දෙකයි සත පනහක් වැනි මුදලක් කුලිය ගෙවනු ලැබේ. ගොයම් කපන දිනයට වැඩ අධික ය. ගොයම් කැපීමට අමතරව කැපූ ගොයම් එකතු කිරීම, ඒවා කොළ මාගලට එකතු කොට පාවර දක්වා ගෙන යාම, පාවරේදී ගොයම් කොළය ගැසීම ආදී කාර්යයන් බොහොමයක් ඇත. 'ගොයම් කොළය' යනු කුඹුරේ සිට ගෙන එනු ලබන ගොයම් එක් රැස් කර වෘත්තාකාරව සාදනු ලබන ගොයම් ගොඩ ය.

**මතු සම්බන්ධයි**